1 වාරය - පුනරීක්ෂණ(2)

✓ පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න. අවශ්‍ය තැන්හි දී වැඩිහිටියෙකුගේ සහය ලබා ගන්න

1. එක්තරා ශිෂ්‍යයකු විසින් සමාන ප්‍රමාණයේ කොපර් සහ සින්ක් කැබලි තබා ඒවා අතරට තනුක සල්ෆියුරික් අම්ලයෙන් පොඟවන ලද කඩදාසි කැබැල්ලක් තබන ලදි. (තහඩු එකිනෙක නොගැටෙන සේ) තහඩු දෙකෙළවර වයර් කැබලි සවිකර ඇත. ඔහු සැකසූ ඇටවුම පහත පරිදි වේ.



i. මෙම ඇටවුමට නමක් දක්වන්න.
ii. මෙහි (+) හා (-) අග්‍ර නම් කරන්න
iii. A හා B දෙකෙළවරට මෝටරයක් සම්බන්ධ කළ විට කුමක් නිරීක්ෂණය කළ හැකි ද ? ඒ සඳහා හේතුව ද දක්වන්න.
iv. මෙම ඇටවුමෙන් ලැබෙනුයේ සරල ධාරාවක් ද ? ප්‍රත්‍යාවර්තක ධාරාවක් ද?
v. ඉහත (iv) හි පිළිතුර තහවුරු කර ගැනීම් සඳහා සිදු කළ හැකි සරල පරීක්ෂණයක් කෙටියෙන් දක්වන්න.
vi. ඉහත ඇටවුම් සඳහා යොදා ගත හැකි සංකේතය ඇඳ දක්වන්න.

2.
i. විදුලි අර්බුදය සඳහා විසඳුමක් ලෙස භාවිත කළ හැකි විද්‍යුත් ප්‍රභව තුනක් සඳහන් කරන්න.
ii. අප නිවෙස් සඳහා ලැබෙන ප්‍රධාන විදුලිය සරල ධාරාවක් ද ප්‍රත්‍යාවර්තක ධාරාවක් ද ?
iii. විද්‍යුත් ප්‍රභව සම්බන්ධයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

	අවස්ථාව	ප්‍රභවය	ක්‍රියාත්මක කරවීමට සපයන ධාරාව	
			සරල ධාරාවකි	ප්‍රත්‍යාවර්තක ධාරාවකි
1	පා පැදියක ලාම්පුව දැල්වීම	ඩයිනමෝව		✓
2	විදුලියෙන් කීන්සි ඔරලෝසුවක් ක්‍රියා කිරීම			
3	ජල විදුලි බලාගාරයක විදුලිය නිපදවීම			
4	ආලෝකය වැටුණු විට ගණක යන්ත්‍රයක් (Calculator) ක්‍රියා කිරීම			
5	කාරයක් පණ ගැන්වීම			